සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 07 | විෂයය / பாடம் / Subject: නර්තනය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | කාලය / காலம் / Time: පැය 2 |

නම :- ........................................................................ විභාග අංකය :- ........................

සැලකිය යුතුයි:
- I කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- අංක 16-20 දක්වා ප්‍රශ්න තෝරාගත යුත්තේ ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායට අනුව ය.

## I පත්‍රය

- අංක 01 සිට 05 දක්වා වාක්‍ය නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද කොටුව තුළ යොදන්න.

(01) නමස්කාර අභ්‍යාස බෙර වාදනයට අනුව කළ හැක. [ ]

(02) කුළු නැටුම සඳහා රන් තෙළඹු වර්ණනාවේ කවි යොදා ගනී. [ ]

(03) ගැටබෙරය විකල්ප වාද්‍ය භාණ්ඩයකි. [ ]

(04) තල මලක් පිපුණ විට ගමට සෞභාග්‍ය උදාවේ. [ ]

(05) 'වැස්ස' තේමාව කරගත් නර්තන නිර්මාණයේ දී සුදුසු චලන ක්‍රියාවක් ලෙස 'සුළඟ' යොදා ගත හැකි ය. [ ]

- පහත සඳහන් රූප සටහන් ඇසුරින් 06 සිට 08 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු වරහන් තුළින් තෝරා ඉරක් අඳින්න.





(06) වැස්සට අධිපති මාරි අම්මාන් සහ ගංගායි අම්මාන් දෙවියන්ගේ ආශිර්වාදය පතා නටනු ලබයි. (A/B)

(07) ද්‍රවිඩ ජනතාවගේ භාරහාර ඔප්පු කරලීම සඳහා නර්තනය කරනු ලබයි. (A/B)

(08) ඉහත පින්තූරවල ඇති නර්තනාංග වන්නේ, (චෙම්බු සහ කාවඩිය / කරගම් සහ කාවඩිය)



215

- ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.

(09) බෙර ඇස සම්බන්ධ කිරීමේ දී වරපටි සඳහා හම් යොදා නොගෙන නියඳ ලණු උපයෝගී කරගන්නා වාද්‍ය භාණ්ඩයකි. (දවුල / තම්මැට්ටම)

(10) 'එම්බල වධකය, මාගේ හිස එක කඩු පහරින් ගසා දමව්' මෙම සිද්ධිය නිරූපණය තුළින් මතුවන භාවය වන්නේ ............................................ යි. (වීර / උත්සාහය)

- A කොටසට සමීප සම්බන්ධතාවයක් දක්වන වචන බන්ධය B කොටසින් තෝරා යා කරන්න.

| | A | B |
|---|---|---|
| (11) | ශාන්ති කර්ම සැරසිලි සඳහා පරිසරයෙන් ලබා ගන්නා අමුද්‍රව්‍යයකි. | ජේ. ඊ. සේදරමන් |
| (12) | වෙසක් කැකුළු අතු අග හිඳ නටන විලාසේ ගීතය පද රචනා කර ඇත. | රාමසාන් |
| (13) | උඩරට නැටුම් කලාව ග්‍රන්ථය රචනා කර ඇත. | පුස්කොළ පොත |
| (14) | තල් ගොබයෙන් නිර්මාණය කරයි. | ගොප්කොළ |
| (15) | මුස්ලිම් ජාතිකයින් නියෝජනය කරයි. | මර්සලින් ජයකොඩි |

- අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න තෝරා ගත යුත්තේ ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායට අනුව ය.

## I කොටස - උඩරට

- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(16) පා සරඹ අවසානයේ
(1) කස්තිරම නටනු ලබයි. (2) සිරුමාරුව නටනු ලබයි.
(3) අඩව්ව නටනු ලබයි. (4) හමාර පදය නටනු ලබයි.

(17) 'සත් වෙත් මඟත් අඳර.....' යන කවිය ගායනා කළ හැක්කේ,
(1) මාත්‍රා 3 + 3 තාල රූපයට ය. (2) මාත්‍රා 2 + 3 තාල රූපයට ය.
(3) මාත්‍රා 2 + 2 තාල රූපයට ය. (4) මාත්‍රා 4 + 4 තාල රූපයට ය.

(18) දෙවියන්ට යහනට ආරාධනා කරමින් ගැයෙන ගී විශේෂය වන්නේ,
(1) කඩතුරා කවි ය. (2) මල් යහන් කවි ය.
(3) ආශිර්වාද කවි ය. (4) ග්‍රහ පංති කවි ය.

(19) ගත්තකු ජිත්තම් ගජිතකු ජිත්තම්............ තරිකිට දොම්කිට තා... මෙම කස්තිරමේ හිස්තැනට සුදුසු පිළිතුර වනුයේ,
(1) තරිකිට ජිත් (2) ගජිං ජිංත කුද
(3) කඩතක තරිකිට (4) ගජිතකු ජිත්තම්

(20) 'තත් තකට තක රොං' මෙය
(1) තුරඟා වන්නමේ කස්තිරමයි. (2) හනුමා වන්නමේ කස්තිරමයි.
(3) තුරඟා වන්නමේ අඩව්වයි. (4) හනුමා වන්නමේ අඩව්වයි.

## II කොටස - පහතරට

- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(16) පා සරඹ අවසානයේ
(1) ඉරට්ටිය නටනු ලබයි.
(2) සීරුමාරුව නටනු ලබයි.
(3) අඩව්ව නටනු ලබයි.
(4) හමාර පදය නටනු ලබයි.

(17) සැමටම භයන්කාර වෙමිනිදු එවන් මුහුල......
(1) මාත්‍රා 3 + 3 තාල රූපයට ය.
(2) මාත්‍රා 2 + 3 තාල රූපයට ය.
(3) මාත්‍රා 2 + 2 තාල රූපයට ය.
(4) මාත්‍රා 4 + 4 තාල රූපයට ය.

(18) දෙවියන්ට යහනට ආරාධනා කිරීමට ගායනා කරනු ලබන කවි විශේෂය වන්නේ,
(1) කඩතුරා කවි ය.
(2) මල් යහන් කවි ය.
(3) ආශිර්වාද කවි ය.
(4) ග්‍රහ පංති කවි ය.

(19) රෙගුද ගදිත ගත............... දොම්' මෙම ඉරට්ටියේ හිස්තැනට සුදුසු පිළිතුර වනුයේ,
(1) ගුදිතක රෙගතකු
(2) ගුදිත ගදිත්තකු
(3) දිමිගත ගුංදත්
(4) දොංත ගදිත ගුද

(20) දිං ගතිගතං දොමිත ගත ගතිති ගතම් තත් තත්..... මෙය
(1) මාත්‍රා 2 + 2 සරල කවි තාලයේ ඉරට්ටියයි.
(2) හනුමන්තා තාලයේ ඉරට්ටියයි.
(3) හවාදී තාලයේ සිංදු වන්නමේ ඉරට්ටියයි.
(4) අනුරාග දණ්ඩ තාලය සිංදු වන්නමේ ඉරට්ටියයි.

## III කොටස - සබරගමු

- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(16) මණ්ඩි පද නටා අවසානයේ,
(1) කලාසම නටනු ලබයි.
(2) තිරුමානම නටනු ලබයි.
(3) අඩව්ව නටනු ලබයි.
(4) හමාර පදය නටනු ලබයි.

(17) සත්නෙත් රජුන් පොරණ.... යන කවිය ගායනා කළ හැක්කේ,
(1) මාත්‍රා 3 + 3 තාල රූපයට ය.
(2) මාත්‍රා 2 + 3 තාල රූපයට ය.
(3) මාත්‍රා 2 + 2 තාල රූපයට ය.
(4) මාත්‍රා 4 + 4 තාල රූපයට ය.

(18) දෙවියන්ට යහනට ආරාධනා කිරීමට ගායනා කරනු ලබන කවි විශේෂය වන්නේ,
(1) කඩතුරා කවිය
(2) මල් යහන් කවිය
(3) ආශිර්වාද කවිය
(4) ග්‍රහ පංති කවිය

(19) තෙයි ගත කුද තෙයි තකට/// තෙයි ගත කුද// තෙයි තකට මෙය,
(1) 4 වන දොඹින පදයයි.
(2) 3 වන දොඹින පදයයි.
(3) 2 වන දොඹින පදයයි.
(4) පළමුවන දොඹින පදයයි.

(20) "තත් තරිඟු තක්තකට" මෙය
(1) කුදිරඩි වන්නමේ කලාසමයි.
(2) අනිලා වන්නමේ කලාසමයි.
(3) කුදිරඩි වන්නමේ අඩව්වයි.
(4) අනිලා වන්නමේ අඩව්වයි.

217

## II පත්‍රය

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.

(01) 'ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා බැඳි සාරධර්ම අනුගමනය කරමු'

(1) ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායට අදාලව ශිල්පීය ප්‍රාගුණ්‍ය එළිදැක්වෙන අවස්ථාව නම් කරන්න. (ලකුණු 02)

(2) ඉහත අවස්ථාවේ දක්නට ලැබුණු චාරිත්‍ර දෙකක් ලියන්න. (ලකුණු 02)

(3) එම ආධුනිකයින් විසින් ඉදිරිපත් කරනු ලබන නර්තන අංග දෙකක් ලියන්න. (ලකුණු 02)

(4) ශිල්පීය ප්‍රාගුණ්‍ය එළිදැක්වීමට සූදානම් වන ආධුනිකයා විසින් දින කීපයකට පෙර සිට පිළිපදිනු ලබන වත්පිළිවෙත් දෙකක් ලියන්න. (ලකුණු 02)

(5) එම අවස්ථාවේ දී ඔබගේ ජීවිතයට ළඟාකරගත හැකි සාරධර්ම දෙකක් ලියන්න. (ලකුණු 02)

(02) (1) දෙතිතේ ප්‍රභේද නම් කරන්න. (ලකුණු 03)

(2) එක් ප්‍රභේදයකට අදාල බෙර පදයක් ප්‍රස්තාර කරන්න. (ලකුණු 03)

(3) එම බෙර පදයේ තාල රූපයට අදාල කස්තිරම / ඉරට්ටිය / කලාසම ලියන්න. (ලකුණු 04)

(03) 'ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායට අදාල ශාන්ති කර්මය හඳුනා ගනිමු.'

(1) ඉගෙන ගන්නා සම්ප්‍රදායට අදාල ප්‍රධාන ශාන්ති කර්මය නම් කරන්න. (ලකුණු 02)

(2) පවතින ප්‍රදේශ දෙකක් ලියන්න. (ලකුණු 02)

(3) පුද ලබන දෙවිවරු දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 02)

(4) වාදන අංග 2ක් සහ නර්තන අංග 2ක් ලියන්න. (ලකුණු 04)

(04) 'රසඥතා වර්ධනය සඳහා විවිධ කලාංගයන්හි සුවිශේෂී ලක්ෂණ විචාරයට ලක් කරමු.'

(1) කතරගම පෙරහැර පැවැත්වීමේ අරමුණු දෙකක් ලියන්න. (ලකුණු 02)

(2) එම පෙරහැර හා සබැඳි චාරිත්‍ර දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(3) ඉහත පෙරහැරේ දැකිය හැකි නර්තන අංග දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(4) ඉන් ඔබ සිත් ගත් නර්තන අංගය පිළිබඳ ඇගයීමක් කරන්න. (ලකුණු 04)

218